# ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල

# ඇබෑර්තු

# පරිපාලන නිලධාරී තනතුර

ක්‍රියාකාරී සහ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති, කළමනාකරණ සහකාර සේවයේ I සහ II ශ්‍රේණිවල පළපුරුද්ද සහිත නිලධාරීන්ගෙන් පරිපාලන නිලධාරී තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. සෞඛ්‍ය සේවයේ පළපුරුද්ද ඇති අයට සේවා කාලය අනුව ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

**සුදුසුකම් සහ පළපුරුද්ද**

අ)

i. කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ පළපුරුද්ද තිබිය යුතුය.

හෝ

ii. වසර 08 කට නොඅඩු ක්‍රියාකාරී සහ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළ II ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතුය.

හෝ

iii. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා ඇති සේවයේ II ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතුය. උපාධිය මානව සම්පත් කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය හෝ ව්‍යාපාර පරිපාලනය යන විෂය පථයකින් විය යුතුය.

සමග

ආ) උසස්වීම් ලබන දිනට පෙර වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

ඇ) අභ්‍යන්තර අයදුම්කරුවන් ඉහත නිර්ණායක සපුරා තිබිය යුතු අතර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් මානව සම්පත් කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය, රාජ්‍ය කළමනාකරණය හෝ ව්‍යාපාර පරිපාලනය යන විෂයයන්ගෙන් උපාධියක් ලබා තිබිය යුතුය.

**වයස** : අවුරුදු 50 නොඉක්මවිය යුතුය (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වයස් සීමාව අදාළ නොවේ).

**වැටුප් පරිමාණය** : වැටුප් කේතය MN 7

**වැටුප් පරිමාණය** : රු. 95,980 – 11 X 1,830 – 18 X 2,490 – 160,930/=

(2027.01.01 දිනට අදාළව)

**රැකියා පැතිකඩ (Job Profile) :**

අදාළ සේවකයා සතු යහපත් කාර්යාලයීය පුරුදු සහ පද්ධතීන් පිළිබඳ දැනුම. ආයතනය වෙත පැවරී ඇති කාර්යයන්ට අදාළ වත්මන් චක්‍රලේඛ උපදෙස් සහ ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන පිළිබඳ දැනුම.

**සේවා නියුක්ති කොන්දේසි -:** ස්ථිර/කොන්ත්‍රාත් සහ අර්ථසාධක අරමුදල් පදනම මත වන අතර ,අනුයුක්ත කිරීම් (Secondment) පදනම ද සලකා බලනු ලැබේ.

රජයේ සේවයේ තනතුරු දරන අයදුම්කරුවන් තම අයදුම්පත් තමන් සේවය කරන ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතු අතර, එහි පිටපතක් සෘජුවම එවිය යුතුය. පත්වීම සඳහා තේරී පත්වුවහොත් අයදුම්කරු සේවයෙන් මුදා හැරිය හැකි බවට ආයතන ප්‍රධානියාගෙන් ලබාගත් සහතිකයක් අයදුම්පතට අමුණා තිබිය යුතුය.

පත්වීමක් කිරීම හෝ නොකිරීමේ අයිතිය ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල් අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

අයදුම්කරන තනතුර ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. අයදුම්කරුවන් තම සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාව (CV) සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ (02) නම් සමග තම අයදුම්පත් 2026 මාර්තු මස 03 වන දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහල,**
**තලපත්පිටිය, නුගේගොඩ.**